**පළමුවන දේව ප්‍රකාශන** 2 සාමුවෙල් 7:1-6 ඒ, 8-11,16

සාමුවෙල්ගේ දෙවන පොතෙන් ගත් පාඨයෙකි.

**"ස්වාමින් වහන්සේ දාවිත්ගේ වංශය සදහටම ස්ථිර කරන සේක."**

දාවිත් රජුගේ සියලු සතුරන්ගෙන් සමිඳාණන් වහන්සේ ඔහුට හැම අතින් ම නිදහස දුන් පසු, ඔහු සිය නිවෙසෙහි වාසය කෙළේ ය. එසේ සිටින අතර රජතුමා නාතාන් නම් දිවැසිවරයාට කතා කොට, "මෙන්න, මම දැන් කිහිරි ගෙයක වසමි. එහෙත්, දෙවියන් වහන්සේගේ ගිවිසුම් කරඬුව කූඩාරමක් ඇතුළේ තිබේ ය"යි කීවේය. එවිට නාතාන් පිළිතුරු දෙමින්, "ඔබ ගොස් ඔබේ සිතේ තිබෙන සියල්ල කරන්න. මන්ද, සමිඳාණන් වහන්සේ ඔබ සමග වැඩ සිටින සේකැ"යි රජුට කීවේ ය.

තවද, එම රාත්‍රියේ සමිඳාණන් වහන්සේගේ පණිවුඩය නාතාන් වෙත පැමිණියේ ය. උන්වහන්සේ මෙසේ වදාළ සේක. "නුඹ ගොස්, සමිඳාණන් වහන්සේ මෙසේ කියන සේකැ"යි මගේ මෙහෙකරු වන දාවිත්ට කියන්න. මාගේ වාසස්ථානය සඳහා මට මාලිගාවක් ගොඩනගන්නට යන්නේ නුඹ ද? මම ඉශ්රායෙල් සෙනග මිසරයෙන් ගෙනා දවසේ පටන් අද දක්වා ගෘහයක වාසය නොකොට කූඩාරමක ද මණ්ඩපයක ද වාසය කෙළෙමි. මාගේ මෙහෙකරු දාවිත්ට මෙසේ කියන්නැ යි සියලු බලැති සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක. මාගේ සෙනග වන ඉශ්රායෙල් කෙරෙහි අධිපතියා වන පිණිස තණ බිමෙන් ද බැටළුවන් පස්සේ යාමෙන් ද මම නුඹ කැඳවාගතිමි. නුඹ ගිය හැමතැන්හි ම මම නුඹ සමග සිට, නුඹේ සතුරන් නුඹ ඉදිරියෙන් සිඳදැමුවෙමි. මිහි පිට සිටින උත්තමයන්ගේ නාමය මෙන් උසස් නාමයක් නුඹට සලසා දෙන්නෙමි. මාගේ සෙනග වන ඉශ්රායෙල් ඔවුන්ට ම හිමි ස්ථානයෙහි වාසය කරමින්, තවත් බැහැර කරනු නොලබන ලෙස මම ඔවුන්ට ස්ථානයක් නියම කොට ඔවුන් ස්ථිර කොට පිහිටුවන්නෙමි. දුෂ්ටයෝ පෙර කළා සේ තවත් ඔවුන්ට හිරිහැර නොකරන්නාහ. එසේ කරන්නේ, මා ඉශ්රායෙල් කෙරෙහි වීර පුරුෂයන් පත් කළ කාලයේ දී මෙන් ය. නුඹේ සියලු සතුරන්ගෙන් නිදහස ලැබෙන්නට සලස්වන්නෙමි. ඇරත්, සමිඳාණන් වහන්සේ නුඹට වංශයක් උපදවා දෙන බව සමිඳාණන් වහන්සේ ම නුඹට දන්වන සේක. නුඹේ වංශය ද රාජශ්‍රීය ද මා ඉදිරියෙහි සදහට ම ස්ථිර කරනු ලබන්නේ ය. නුඹේ සිංහාසනය සදහට ම පිහිටුවනු ලබන්නේ ය."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**පිළිතුරු ගීය**

ගීතාවලිය 89:1-4, 26,28

**පිළිතුර : සමිඳුනි, ඔබේ තිරපෙම ගැන මම සදහට ම ගයන්නෙමි.**

**ගීය :** සමිඳුනි, ඔබේ තිර පෙම ගැන මම සදහට ම ගයන්නෙමි.
ඔබේ විශ්වාසවන්තකම පරපුරෙන් පරපුරට පවසන්නෙමි.
ඔබේ තිර පෙම සදහට ම පවතින බව මම ඒකාන්තයෙන් ම පිළිගනිමි.

ඔබේ විශ්වාසවන්තකම අහස මෙන් තිරසර බව මම දනිමි.

ඔබ මෙසේ වදාළ සේක.

"මා තෝරාගත් තැනැත්තා සමග මම ගිවිසුමක් කෙළෙමි.

මාගේ සේවක දාවිත්ට මම මෙසේ දිවුළෙමි. "මම ඔබේ පෙළපත සදහට ම පිහිටුවන්නෙමි. පරපුරෙන් පරපුරට ඔබේ සිහසුන ගොඩනගන්නෙමි."

ඔහු මට මොරගසමින්, "ඔබ මාගේ දෙවිදාණෝ ය, මාගේ පියාණෝ ය, මාගේ ආරක්ෂක පර්වතයාණෝ ය"යි කියන්නේය. මම ඔහුට සදහට ම ප්‍රේම කරන්නෙමි. ඔහු උදෙසා මාගේ ගිවිසුම ස්ථිර ව පවත්නේ ය.

**<u>දෙවන දේව ප්‍රකාශනය</u>** රෝම 16:25-27

ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් ගත් කොටසකි.

**කල්පාන්තරයන්හි සැඟවී තිබූ අභිරහස එළිදරව් වේ.**

දෙවියන් වහන්සේට මහිමය වේවා! ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ පිළිබඳ පණිවුඩය හා මා දේශනා කළ සුබ අස්න අනුව ද දීර්ඝ කල්පාන්තරයන්හි සැඟවී තිබී දැන් එළිදරව් කොට ඇති අබිරහස අනුව ද ඔබ ඇදහිල්ලෙහි ස්ථිර ලෙස පිහිටුවීමට උන්වහන්සේ පොහොසත් වන සේක. දැන් වනාහි ඒ අබිරහස දිවැසිවරයන්ගේ ලියවිලිවලින් අනාවරණය කර ඇත. සියල්ලන් ම අදහා කීකරු වන පිණිස, සදාතන දෙවියන් වහන්සේගේ ආඥාවෙන් එය සකල ජාතීන්ට ප්‍රකාශකොට ඇත. සකල ප්‍රඥාවෙන් යුක්ත වූ අසමසම දෙවියන් වහන්සේට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කරණකොටගෙන සදහට ම මහිමය වේවා! ආමෙන්.

දේව වාක්‍යය එසේය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සුබ සුවත් ජය නද</u>** ලූක් 1:38

ආලේලූයා ! ආලේලූයා !

"බලන්න, මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි.

ඔබ පැවසූ ලෙසම මට සිදුවේවා

ආලේලූයා !

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** ලූක් 1:26-38

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**"ඔබ පිළිසිඳගෙන පුතකු ලබන්නෙහි ය."**

සවැනි මස, ගාබ්‍රියෙල් නම් දේව දූතයා දෙවියන් වහන්සේ විසින් ගලීලයේ නාසරෙත් නම් නුවර විසූ, දාවිත් රජ පරපුරෙන් පැවත එන ජෝසෙප් නම් මනුෂ්‍යයෙකු හට විවාහ ගිවිසුම් දී සිටි කන්‍යාවක වෙත යවන ලදී. ඒ කන්‍යාවගේ නම මරියා ය. දේව දූතයා ඈ සිටි තැනට පැමිණ, "විපුල ප්‍රසාදලත් උත්තමිය, ඔබට මංගල වේ. සමිඳාණන් වහන්සේ ඔබ සමග ය"යි කීය. එහෙත්, ඈ ඒ වදන් අසා අතිශයින් කැළඹී මේ කෙබඳු ආචාරයක් දැයි සිත සිතා සිටියා ය. දේව දූතයා ඈට කතා කොට, "මරියාණනි, බිය නොවන්න, ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාදය ලද්දෙහි ය. මේ බලන්න, ඔබ පිළිසිඳගෙන පුතෙකු ලබන්නෙහි ය. උන්වහන්සේට "ජේසුස්" යන නාමය තබන්න. "උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක,

පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක. උන්වහන්සේගේ පිය වූ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමීන් වහන්සේ උන්වහන්සේට ප්‍රදානය කරන සේක. උන්වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සදහට ම රජකම් කරන සේක. උන්වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නොදක්නේ ය"යි කීය.

එවිට මරිය තුමී දේව දූතයාට කතා කොට, "මට පුරුෂයෙකු නැති බැවින් මෙවැන්නක් කෙසේ විය හැකි දැ"යි ඇසුවා ය. දේව දූතයා ඈට උත්තර දෙමින්, ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ද ඔබ වසාගන්නේ ය. එහෙයින් උපදින පරිශුද්ධ දරුවා දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක. බලන්න, ඔබේ ඥාතිවරිය වන එලිසබෙත් ඇගේ මහලු වයසේ දී පුතෙකු පිළිසිඳගත්තා ය. වඳයයි කී ඇයට දැන් සවැනි මාසයය. මක්නිසා ද, දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැතැ"යි කීවේ ය. මරිය තුමී කතා කරමින්, "බලන්න, මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙස ම මට ඉටු වේවා"යි කීවාය. එවිට දේව දූතයා ඈ කෙරෙන් වෙන් ව ගියේ ය.

සමිඳුණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.